කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018

**INR 4281 - ජාත්‍යන්තර මානුෂවාදී නීතිය**

**<u>කාලය පැ දෙකයි (02)</u>**

ඕනෑම ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න

---

1. "පසුගිය සියවසේ යුධකටයුතු වල පරිණාමය නිසා ජාත්‍යන්තර අවි ගැටුම් (International Armed Conflicts) සහ ජාත්‍යන්තර නොවන අවි ගැටුම් (Non-International Armed Conflicts) යන වර්ගීකරණයන් ඇති වී තිබේ". ඉහත ප්‍රකාශය ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (ICRC) පැහැදිලි කිරීම් සහ ජාත්‍යන්තර සබඳතාහි අනෙකුත් සමකාලීන වර්ධනයන් සැළකිල්ලට ගනිමින් පැහැදිලි කරන්න.
2. ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලධර්ම වලට ප්‍රායෝගික වැදගත්කමක් ලබාදෙමින් චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ (Customary International Humanitarian Law) වැදගත්කම විශ්ලේෂණය කරන්න.
3. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අදාළ විධිවිධාන භාවිතා කරමින් *ජුස් ඉන් බෙලෝ* / Jus in bello (ජාත්‍යන්තර මානුෂවාදී නීතිය) සහ *ජුස් ඇඩ් බෙලම්* / Jus ad bellum (බලය භාවිතා කිරීම) අතර ඇති වෙනස විස්තර කරන්න.
4. "ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ ඉතාමත්ම වැදගත් මූලධර්මය ලෙස *වෙන් කර හඳුනා ගැනීමේ මූලධර්මය* (Principle of Distinction) සැලකේ". මෙහි භාවිතය 'සිවිල් පුද්ගලයන් සෘජුවම එදිරිවාදිකම් වලට සහභාගී වීම' (Directly Participating in Hostilities) ඇසුරෙන් විස්තර කරන්න.
5. ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිවල මූලධර්ම අදාළ කරගනිමින් 'ගෝලීය ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' (Global War on Terror) පිළිබඳ රචනාවක් ලියන්න.
6. පහත ඕනෑම **<u>තුනකට (03)</u>** කෙටි සටහන් ලියන්න.
   i. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC)
   ii. *ඔපිනියෝ ජුරිස් සිවේ නෙසෙසිටාටිස් (Opinio Juris Sive Necessitatis)*
   iii. ජිනීවා සම්මුතියෙ තුන්වන පොදු වගන්තිය (Common Article 3 of Geneva Conventions)
   iv. 1977 අතිරේක ප්‍රොටෝකෝල I හි 75 වන වගන්තිය යටතේ මූලික වගකීම් (Fundamental Guarantees)
   v. මානුෂවාදී මැදිහත්වීම (Humanitarian Intervention)
   vi. උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසම (LLRC) සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය

UNIVERSITY OF COLOMBO – SRI LANKA

FACULTY OF ARTS

FOURTH YEAR EXAMINATION IN ARTS SEMESTER II – 2017/2018

**INR 4281: International Humanitarian Law**

Time: **Two (02)** hours

Answer **three (03)** questions only.

1) "Evolution of warfare during the last century has resulted in two categories - International Armed Conflicts (IACs) and Non-International Armed Conflicts (NIACs)". Explain this statement considering clarifications provided by the International Committee of the Red Cross (ICRC) and other contemporary developments in International Relations.

2) Analyze the importance of 'Customary International Humanitarian law (CIHL)' in giving practical significance to principles of International Humanitarian Law.

3) Utilizing relevant provisions of the Charter of the United Nations, analyze the difference between *Jus in bello (International Humanitarian Law) and Jus ad bellum (Use of Force).*

4) "*Principle of Distinction* is said to be the most significant principle of International Humanitarian Law". Describe its application with regard to the 'Direct Participation in Hostilities (DPH)' by Civilians.

5) Write an essay on 'the global war on terror' with reference to principles of International Human Rights and International Humanitarian Law.

6) Write short notes on any **three (03)** of the following:

    I. International Committee of the Red Cross (ICRC)
    II. *Opinio Juris Sive Necessitatis*
    III. Common Article 3 of Geneva Conventions
    IV. *Fundamental Guarantees* under Article 75 of Additional Protocol I of 1977
    V. Humanitarian Intervention
    VI. The Lessons Learnt and Reconciliation Commission Report and International Humanitarian Law

**********************